මගේ අංකය: JSC/SEC/CIR- L/2022

**අධිකරණ සේවා කොමිෂන් සභා චක්‍රලේඛ ලිපි අංක : 11 /2022**

සියලුම මහාධිකරණ විනිශ්චයකාරවරුන්,

සියලුම අධිකරණ නිලධාරීන්,

සියලුම කම්කරු විනිශ්චයාධිකාර සභාපතිවරුන් සහ

රෙජිස්ට්‍රාර් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත,

<u>මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහි වූ තැනැත්තන් ප්‍රතිකාර හා පුනරුත්ථාපනයට යොමු කිරීම සම්බන්ධවයි.</u>

ශීර්ෂගත කරුණට අදාලව අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය හරහා අධිකරණ සේවා කොමිෂන් සභාව වෙත යොමු වී ඇති ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ අංක **MOD/DS/NDDCB/01/2021/28** හා 2022.07.22 දිනැති ලිපිය හා අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ සභාපති විශේෂඥ වෛද්‍ය ප්‍රියංගි අමරබන්දු මහත්මිය විසින් මා අමතා ඇති අංක **2022/NDDCB/TR/MOJ** හා 2022.06.30 දිනැති ලිපියත් පිළිබඳව සලකා බැලූ අධිකරණ සේවා කොමිෂන් සභාව එම ලිපි අධිකරණ සේවා කොමිෂන් සභාවේ වෙබ් අඩවියේ පලකොට ඔබගේ අවධානයට ලක්කරන ලෙසට මට නියම කර ඇත.

02. ඒ අනුව එම ලිපි අධිකරණ සේවා කොමිෂන් සභාවේ වෙබ් අඩවියේ පලකරමි.

අධිකරණ සේවා කොමිෂන් සභාවේ අණ පරිදි,

එච්. සංජීව සෝමරත්න

ලේකම්

අධිකරණ සේවා කොමිෂන් සභාව

එච්. සංජීව සෝමරත්න
ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව
කොළඹ 12

2022 සැප්තැම්බර් මස 20 වන දින

කොළඹ 12

අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේදීය

ආරක්ෂක අමාත්‍යාංශය
பாதுகாப்பு அமைச்சு
MINISTRY OF DEFENCE
ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ, ශ්‍රී ලංකාව.
பாதுகாப்பு தலைமையக கட்டிடம், ஸ்ரீ ஜயவர்தனபுர, கோட்டே, இலங்கை.
Defence Headquarters Complex, Sri Jayawardenepura, Kotte, Sri Lanka. Website : www.defence.lk

තැ. පෙ. / த. பெட்டி / P.O. Box 572 | දුරකථන / தொலைபேசி / Telephone 2430860-9, 2430870-8 | ලේකම් / செயலாளர் / Secretary: දුර./தொ./Tel. ..., ෆැක්ස්/தொ.ந/Fax ..., වි. තැපෑල/மி.அ./Email secdefence@defence.lk


NORMAL POST

මගේ අංකය / My No: MOD/DS/NDDCB/01/2021/28
ඔබේ අංකය / Your No:
දිනය / திகதி / Date: 2022.07.22

ලේකම්
අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය

**<u>මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වූ තැනැත්තන් ප්‍රතිකාර හා පුනරුත්ථාපනයට යොමු කිරීම සම්බන්ධවයි</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ සභාපතිනියගේ අංක 2022/NDDCB/TR/MOJ හා 2022.06.30 දිනැති ලිපිය හා බැදේ. (ඇමුණුම i)

02. 1984 අංක 11 දරන අන්තරායදායක ඖෂධ පාලනය කිරීමේ ජාතික මණ්ඩලය පනත යටතේ පිහිටුවන ලද මෙම අමාත්‍යාංශය යටතේ අධීක්ෂණයවන අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය, ඖෂධ අයුතු ලෙස භාවිතා කරන්නන්ට අදාළව වැළැක්වීමේ, පාලනය කිරීමේ, ප්‍රතිකාර කිරීමේ හා පුනරුත්ථාපනය කිරීමේ ජාතික ප්‍රතිපත්තිය සකස් කිරීමේ හා සමාලෝචනය කිරීමේ වගකීම භාර ව්‍යවස්ථාපිත ආයතනය වේ.

03. මෙම මණ්ඩලය මගින් ක්‍රියාත්මක කරනු ලබන ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානවලට සේවාලාභීන් යොමුකිරීමේදී නේවාසික ප්‍රතිකාර ලබාදීම සඳහා පවතින ඉඩකඩ සීමා සහිත වීම, කාර්ය මණ්ඩල හිඟය, ස්වේච්ඡාවෙන් ප්‍රතිකාර ලබාගැනීම සඳහා ඉල්ලුම්කරන සේවාලාභීන් වැඩිවීම හේතුවෙන් ගරු අධිකරණය මගින් යොමු කරනු ලබන සේවාලාභීන් වර්තමානයේ පවතින ආර්ථික අර්බුදයද සැළකිල්ලට ගනිමින් පහත පරිදි ඇතුළත්කර ගැනීමට ඔබ අමාත්‍යාංශයේ සහ අධිකරණ සේවා කොමිෂන් සභාවේ අවධානය යොමු කරවන ලෙස එම මණ්ඩලයේ සභාපතිනිය විසින් ඉල්ලීමක් සිදුකර ඇත.

| අනු අංකය | ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථාන | එක් කණ්ඩායමකට උපරිම වශයෙන් කබාගත හැකි අධිකරණය මගින් යොමු කරන සේවාලාභීන් සංඛ්‍යාව |
|---|---|---|
| 1 | නවදිගන්තය, ඌරාපොළ | 30 |
| 2 | මෙත්සෙවණ, මහනුවර | 10 |
| 3 | මිත්සෙවණ, ගාල්ල | 10 |
| 4 | සෙත්සෙවණ, තලංගම | 10 |

04. තවද, 2007 අංක 54 දරන මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවූවන් පුනරුත්ථාපනය කිරීමේ පනත යටතේ නම්කර ඇති පහත සඳහන් බන්ධනාගාර ආශ්‍රිතව පවත්වාගෙන යනු ලබන පුනරුත්ථාපන වැඩසටහන් සඳහාද මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවූවන් යොමුකළ හැකි බවද සභාපතිනියගේ යොමුගත ලිපිය මගින් දන්වා ඇත.

i. පබෝදා මෙත්සෙවන ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය - අඹේපුස්ස
ii. පල්ලේකැලේ එළිමහන් සිරකඳවුර
iii. වීරවිල එළිමහන් සිරකඳවුර
iv. කළුතර බන්ධනාගාරය
v. පල්ලන්සේන බන්ධනාගාරය

vi. වටරැක බන්ධනාගාරය
vii. අනුරාධපුරය බන්ධනාගාරය
viii. කන්දෙවත්ත එළිමහන් සිරකඳවුර
ix. මිතිරිගල එළිමහන් සිරකඳවුර
x. තල්දෙන බන්ධනාගාරය
xi. කන්දකාඩු ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය

05. එසේම වර්තමානයේ පවතින මූල්‍ය හා ආර්ථික දුෂ්කරතා හේතුවෙන් අධිකරණය වෙතින් නේවාසික ප්‍රතිකාර සඳහා යොමුකරන සේවාලාභීන්ගේ නේවාසික හා පුනරුත්ථාපන කාලසීමාව උපරිම මාස තුනකට සීමා කිරීම කෙරෙහිද අවධානය යොමුකළ යුතු බවද දන්වා ඇත.

06. ඒ අනුව, උක්ත සඳහන් කරුණු පිළිබඳව ඔබගේ කාරුණික අවධානය යොමුකර අවශ්‍ය ඉදිරි කටයුතු සිදුකරන ලෙස කාරුණිකව ඉල්ලා සිටිමි.

ටී.ඒ.ජේ. එදිරිසිංහ
අතිරේක ලේකම් (ආරක්ෂක සේවා )

අත්/කළේ :- **ජෙනරාල් කමල් ගුණරත්න (විශ්‍රාමික)**
**ඩබ්ඩබ්වී ආර්ඩබ්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීසී**
**පීඑස්සී එම්ෆිල්**
ලේකම්
ආරක්ෂක අමාත්‍යාංශය

පිටපත :-
සභාපතිනි, අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය - කරු. දැ.ගැ.ස.

අනතුරුදායක ඖෂධ පාලක ජාතික මණ්ඩලය
தேசிய அபாயகர ஔடதங்கள் கட்டுப்பாட்டுச் சபை
National Dangerous Drugs Control Board
ආරක්ෂක අමාත්‍යාංශය
பாதுகாப்பு அமைச்சு
Ministry of Defence

BY HAND

මගේ අංකය / எனது இல்லை / My No: 2022/NDDCB/TR/MOJ
ඔබේ අංකය / உமது இல்லை / Your No:
දිනය / திகதி / Date: 2022.06.30

වෙත :ලේකම්,
අධිකරණ සේවා කොමිෂන් සභාව,
අංක 573,
අලුත් කඩේ,
කොළඹ 12.

මගින් : ලේකම්
ආරක්ෂක අමාත්‍යාංශය

මගින් : ලේකම්
අධිකරණ අමාත්‍යාංශය

**මත්ද්‍රව්‍යයට ඇබ්බැහි වූ තැනැත්තන් ප්‍රතිකාර හා පුනරුත්ථාපනයට යොමු කිරීම සම්බන්ධවයි.**

මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවූවන් නේවාසිකව තබා පුනරුත්ථාපනයට යොමු කිරීම සම්බන්ධව ගරු අධිකරණය විසින් අපවෙත ලබාදෙන්නාවූ සේවාව ඉතා අගය කොට සලකමු. රටේ පවතින වර්තමාන ආර්ථික සහ අනෙකුත් ගැටළු සලකා බලා අපගේ ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානවලට පුනරුත්ථාපනය සඳහා සේවාලාභීන් යොමු කිරීමේදී පහත සඳහන් කරුණු පිළිබඳව ගරු අධිකරණයේ විශේෂ අවධානය යොමු කරන ලෙස ගෞරවයෙන් ඉල්ලා සිටිමු.

1. මණ්ඩලයේ ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානවල නේවාසික ප්‍රතිකාර සේවාවන් ලබා දීමට පවතින ඉඩකඩ සීමාසහිත බව, කාර්ය මණ්ඩල හිඟය, ස්වේච්ඡාවෙන් ප්‍රතිකාර සඳහා ඉදිරිපත්වන සේවාලාභීන්ගේ ප්‍රතිකාර සේවා ලබා ගැනීමේ ඉල්ලුම ඉහළ යාම යනාදී හේතූන් සලකා බලා අපගේ මධ්‍යස්ථානවලට උපරිම වශයෙන් පහත සඳහන් ආකාරයට අධිකරණ මගින් යොමු කරන සේවාලාභීන් ඇතුළත් කර ගැනීම පිළිබඳව අවධානය යොමු වීම.

| අනු අංකය | මධ්‍යස්ථානය | එක් කණ්ඩායමකට උපරිම වශයෙන් තබා ගත හැකි අධිකරණය මගින් යොමු කරන සේවාලාභීන් සංඛ්‍යාව |
|---|---|---|
| 01 | නවදිගන්තය - මාහේනවත්ත, ඌරාපොළ | 30 |
| 02 | මෙත්සෙවණ - මාම්පිටියවත්ත, හන්දෙස්ස, මහනුවර | 10 |
| 03 | මිත්සෙවණ - උණවටුන, ගාල්ල | 10 |
| 04 | සෙත්සෙවණ - තලංගම, කොස්වත්ත | 10 |

2. 2007 අංක 54 දරන මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවූවන් පුනරුත්ථාපනය කිරීමේ පනත යටතේ නම් කර ඇති පහත සඳහන් බන්ධනාගාර ආශ්‍රිතවද පවත්වාගෙන යනු ලබන පුනරුත්ථාපන වැඩසටහන් සඳහා ද

කෝට්ටේ පාර, රාජගිරිය / கோட்டே வீதி இராஜகிரிய / Kotte Road, Rajagiriya, Sri Lanka
දුරකථන / தொலைப்பேசி / Telephone: 011-2868794, 011-2868795, 011-2868796
ෆැක්ස් / பக்ஸ் / Fax: 011-2868794, 011-2868795, 011-2868796
ක්ෂණික ඇමතුම / உடனடி அழைப்பு / Hot Line: 1927
E-mail: mail@nddcb.gov.lk
Web: www.nddcb.gov.lk

මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවූවන් යොමු කළ හැකි බව ගරු අධිකරණයේ අවධානය සඳහා කාරුණිකව ඉදිරිපත් කරමි. එනම්,

| අනු අංකය | නම | ලිපිනය | දුරකථන අංකය |
|---|---|---|---|
| 01 | පබෝධා මෙත්සෙවන ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය - අඹේපුස්ස | පබෝධා මෙත්සෙවන ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය, අඹේපුස්ස, | 035 4677525 |
| 02 | පල්ලේකැලේ එළිමහන් සිරකඳවුර | එළිමහන් සිරකඳවුර, පල්ලෙකැලේ, කුණ්ඩසාලෙ | 081 4677546 |
| 03 | වීරවිල එළිමහන් සිරකඳවුර | එළිමහන් සිරකඳවුර, වීරවිල | 047 4677549<br>047 4677527 |
| 04 | කළුතර බන්ධනාගාරය | ශ්‍රී ලංකා බන්ධනාගාරය කළුතර, කළුතර | 034 4939552 |
| 05 | පල්ලන්සේන බන්ධනාගාරය | තරුණ වරදකරුවන්ගේ විශෝධන මධ්‍යස්ථානය, දළුපොත, මීගමුව | 031 4677501 |
| 06 | වටරැක බන්ධනාගාරය | වටරැක එළිමහන් බන්ධනාගාර කඳවුර, බස්නාහිර පලාත, මීගොඩ | 011 4677517 |
| 07 | අනුරාධපුර බන්ධනාගාරය | ශ්‍රී ලංකා බන්ධනාගාරය අනුරාධපුර, අනුරාධපුර | 025 4677501 |
| 08 | කන්දේවත්ත එළිමහන් සිරකඳවුර | බන්ධනාගාර එළිමහන් කඳවුර, කන්දෙවත්ත, මීතිරිගල | 011 4677545<br>011 4677576 |
| 09 | මීතිරිගල එළිමහන් සිරකඳවුර | බන්ධනාගාර එළිමහන් කඳවුර, මීතිරිගල | 011 4677545<br>011 4677578 |
| 10 | තල්දෙන බන්ධනාගාරය | ශ්‍රී ලංකා බන්ධනාගාරය, තල්දෙන තරුණ වරදකරුවන්ගේ විශෝධන මධ්‍යස්ථානය, තල්දෙන, බදුල්ල | |
| 11 | කන්දකාඩු ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය | කන්දකාඩු ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය, කන්දකාඩු, පොළොන්නරුව | 024 3244959 |

3. වර්තමානයේ මණ්ඩලයේ පවතින මූල්‍ය දුෂ්කරතාවය සහ රටේ පවතින ආර්ථික සහ අනෙකුත් ගැටළු සලකා බලා අධිකරණය මගින් අපවෙත නේවාසික ප්‍රතිකාරය සඳහා යොමු කරන සේවාලාභීන්ගේද නේවාසික ප්‍රතිකාර හා පුනරුත්ථාපන කාලය උපරිම මාස තුනකට සීමා කිරීම කෙරෙහි ගරු අධිකරණයේ අවධානය සඳහා යොමු කරමි.

විශේෂඥ වෛද්‍ය ප්‍රියංගි අමරබන්දු
සභාපතිනි